# ඉස්ලාම් ආගමේ ඉගැන්වෙන කාන්තා අයිතිවාසිකම් මුස්ලිම් සමාජයට කෙතරම් ප්‍රායෝගිකද ?

එම්.එම්.එම්.සාබිර්

සාරසංක්ෂේපය

***ඔබ සියලු දෙනා ඇතුළු මෙම විශ්වය සහ පරලොව සියලු දේ දෙවියන් වහන්සේ විසින් මැවූ බව අල් කුරානය සඳහන් කරත්වා. මනුෂ්‍යයාණෙනි, ඔබ සියලු දෙනා පිරිමියෙක් සහ ගැහැනියක් මගින් බිහි කළෙමු. නුඹලා එකිනෙකා හඳුනා ගැනීම සඳහා කුල ගෝත්‍රික වශයෙන් වෙන් කළෙමු. නුඹලාගෙන් ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයා වන්නේ දෙවියන් වහන්සේට භක්ති පිරිනමන්නන් පමණි.*** යනුවෙන් කුරානය සඳහන් කරයි. එහි අර්ථය වන්නේ සියලු දෙනා ම සමාන බවයි.

එනමුත් මුස්ලිම් සමාජය තුළ යම් යම් අවස්ථාවල කාන්තා පාර්ශවයට නිසි තැනක් ලබා නොදෙන බවට විවේචනය එල්ලවීම දිගින් දිගට ම සිදු වෙමින් පවතී. මේ සඳහා විවේචන ඉදිරිපත් කරන පිරිස් හේතු වශයෙන් ඉදිරිපත් කරන්නේ කාන්තාවන් පල්ලියට නොයාම, අධ්‍යාපනය , විවාහය , ඇඳුම් පැළඳුම් ,රැකියා ආදිය සම්බන්ධයෙන් නිදහසේ තීරණ ගැනීමට සීමා පැනවීම යනාදියයි.

මුස්ලිම්වරුන්ගේ අවසාන ශාස්තෘවරයා වන මුහම්මද් නබිතුමාණන්ගේ කාලය තුළ කාන්තාවන් භුක්ති විඳි නිදහස කුමක් ද? සත්‍ය වශයෙන් ම ඉස්ලාම් ආගම කාන්තා පාර්ශවයට නිදහස ලබා නොදී තිබේද? යනාදිය කෙරෙහි අවධානය යොමු කරමින් නිසි පිළිතුරු සපයා ගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ.